# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1780/6 - 2012 ඔක්තෝබර් මස 15 වැනි සඳුදා - 2012.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### පඩි පාලක සභා ආඥාපනත

නිවේදනය

**ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධි විධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 07 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවක්ම, එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව.

2012 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1978 අගෝස්තු මස 11 වැනි දින අංක 330 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද සහ අවසන් වරට 2010 ජූලි මස 30 වැනි දින අංක 1664/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙන් වෙනස් කරන ලද්දා වූ තීරණවල II කොටස වෙනුවට පහත සඳහන් ඡේදයන් ආදේශ කිරීමෙන් එම උපලේඛනය තව දුරටත් වෙනස් කළ යුතු ය :

(අ) ක්‍රියාකාරී සේවාවන් : ආරක්ෂක නිලධාරින්, ආරක්ෂක භටයින්, මුරකරුවන්, පැට්රෝල්මන් හෝ කිනම් නමින් හැඳින්වුව ද ක්‍රියාකාරි සේවාවන් හි යෙදෙන සේවකයන්,

(ආ) පාලනමය සේවාවන් : ක්‍රියාකාරී සේවාවන්හි පාලනයෙහි නියුක්ත සේවකයන්, කාර්යභාර නිලධාරින්, මුර සේවා භාර සුපවයිසර්වරු හෝ සුපවයිසර්වරු.

1A - G 016756 — 345 (2012/10)

*අවම මාසික වේතනය*

| *සේවා වසර* | *ක්‍රියාකාරී සේවාවන්* <br> *රු. ශත* | *පාලනමය සේවාවන්* <br> *රු. ශත* |
|---|---|---|
| 1 වන වසර | 8,820.00 | 9,440.00 |
| 2 වන වසර | 8,920.00 | 9,590.00 |
| 3 වන වසර | 9,020.00 | 9,740.00 |
| 4 වන වසර | 9,120.00 | 9,890.00 |
| 5 වන වසර | 9,220.00 | 10,040.00 |
| 6 වන වසර | 9,320.00 | 10,190.00 |
| 7 වන වසර | 9,420.00 | 10,340.00 |
| 8 වන වසර | 9,520.00 | 10,490.00 |
| 9 වන වසර | 9,620.00 | 10,640.00 |
| 10 වන වසර | 9,720.00 | 10,790.00 |
| 11 වන වසර | 9,820.00 | 10,940.00 |
| 12 වන වසර | 9,920.00 | 11,090.00 |
| 13 වන වසර | 10,020.00 | 11,240.00 |
| 14 වන වසර | 10,120.00 | 11,390.00 |
| 15 වන වසර | 10,220.00 | 11,540.00 |
| 16 වන වසර | 10,320.00 | 11,690.00 |
| 17 වන වසර | 10,420.00 | 11,840.00 |
| 18 වන වසර | 10,520.00 | 11,990.00 |
| 19 වන වසර | 10,620.00 | 12,140.00 |
| 20 වන වසර | 10,720.00 | 12,290.00 |
| 21 වන වසර | 10,820.00 | 12,440.00 |
| 22 වන වසර | 10,920.00 | 12,590.00 |
| 23 වන වසර | 11,020.00 | 12,740.00 |
| 24 වන වසර | 11,120.00 | 12,890.00 |
| 25 වන වසර | 11,220.00 | 13,040.00 |
| 26 වන වසර | 11,320.00 | 13,190.00 |

11-40/1

**පඩි පාලක සභා ආඥාපනත**

නිවේදනය

**තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරයවන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධි විධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2012 නොවැම්බර් මස 07 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවක්යම, ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව.

2012 සැප්තැම්බර් මස 03 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

තේ පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1945 ජූලි මස 21 වැනි දින අංක 9436 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2010 ජුනි මස 30 වැනි දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දා වූ ද තීරණ එම උපලේඛනයේ II කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය් කළ යුතු ය.

*II වන කොටස*

**සේවකයාගේ පන්තිය**

*II වන ශ්‍රේණිය*

සැම්පල් පිළියෙල කිරීම, පෙට්ටිවල පියන් හැර එහි ඇතුළත දේ පිටට හැලීම, හිස් පෙට්ටිවල බර කිරීම, පැක් කිරීම, කඩදාසි හා ඊයම් කොළ කැපීම, පෝරු දැමීම, පෙට්ටිවල තේ ඇහිරීම, එළියේ තැබීම, උඩ පැත්ත පෝරු කිරීම හා ගිනි වතුරෙන් පැස්සීම, පියන් දැමීම හා ඇණ ගැසීම, වලයන් දැමීම හා කම්බි දැමීම, පරණ සළකුණ සූරා දැමීම, ලකුණු කිරීම හා අච්චුවෙන් අකුරු දැමීම, ඊයම් පැකට් සෑදීම හා ගිනි වතුරෙන් පැස්සීම, පැකට්ටු සෑදීම, බර කිරීම, පැකට්ටු කිරීම, ලේබල් ඇලවීම, ජුටේසින් කවර කැපීම හා සෑදීම, ජුටේසින් වලින් එතීම, ස්ටෝරු හා කානු ශුද්ධ කිරීම හා පිස දැමීම, කැපීම හා ඇවිස්සීම හා නැවත ගින්නෙන් රත් කිරීම, අමු තේ පාට කිරීම යන මේවායේ නිරත සේවකයෝ.

*මධ්‍යම ශ්‍රේණිය*

තේ පුරවා පෙට්ටි කිරීම, අතින් බල්ක් කිරීම, අතින් කලවම් කිරීම යන මේවායේ නිරත සේවකයෝ, පෙට්ටි සාදන්නන් හා අළුත්වැඩියා කරන්නන්.

*I වන ශ්‍රේණිය*

පෙට්ටි බෑම හා ගෙනයාම, අඩුක් කිරීම, කලවම් කරන තැනට පෙට්ටි ගෙනයාම, ස්ටෝරුවට ගෙන ගොස් නැවත අඩුක්කිරීම, පෙට්ටි එළියේ දැමීම, නැවට යැවීමට පැටවීම යන මේවායේ නිරත සේවකයෝ,

*මුරකරුවන්.*

*මාසය සඳහා ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය*

| සේවා වසර | *II ශ්‍රේණිය* රු. ශත | මධ්‍යම ප්‍රමාණය රු. ශත | *I ශ්‍රේණිය* රු. ශත | මුරකරුවන් රු. ශත |
|---|---|---|---|---|
| 1 වන වසර | 9,660.00 | 10,080.00 | 10,500.00 | 9,660.00 |
| 2 වන වසර | 9,760.00 | 10,205.00 | 10,650.00 | 9,760.00 |
| 3 වන වසර | 9,860.00 | 10,330.00 | 10,800.00 | 9,860.00 |
| 4 වන වසර | 9,960.00 | 10,455.00 | 10,950.00 | 9,960.00 |
| 5 වන වසර | 10,060.00 | 10,580.00 | 11,100.00 | 10,060.00 |
| 6 වන වසර | 10,160.00 | 10,705.00 | 11,250.00 | 10,160.00 |
| 7 වන වසර | 10,260.00 | 10,830.00 | 11,400.00 | 10,260.00 |
| 8 වන වසර | 10,360.00 | 10,955.00 | 11,550.00 | 10,360.00 |
| 9 වන වසර | 10,460.00 | 11,080.00 | 11,700.00 | 10,460.00 |
| 10 වන වසර | 10,560.00 | 11,205.00 | 11,850.00 | 10,560.00 |
| 11 වන වසර | 10,660.00 | 11,330.00 | 12,000.00 | 10,660.00 |
| 12 වන වසර | 10,760.00 | 11,455.00 | 12,150.00 | 10,760.00 |
| 13 වන වසර | 10,860.00 | 11,580.00 | 12,300.00 | 10,860.00 |
| 14 වන වසර | 10,960.00 | 11,705.00 | 12,450.00 | 10,960.00 |
| 15 වන වසර | 11,060.00 | 11,830.00 | 12,600.00 | 11,060.00 |
| 16 වන වසර | 11,160.00 | 11,955.00 | 12,750.00 | 11,160.00 |
| 17 වන වසර | 11,260.00 | 12,080.00 | 12,900.00 | 11,260.00 |
| 18 වන වසර | 11,360.00 | 12,205.00 | 13,050.00 | 11,360.00 |
| 19 වන වසර | 11,460.00 | 12,330.00 | 13,200.00 | 11,460.00 |
| 20 වන වසර | 11,560.00 | 12,455.00 | 13,350.00 | 11,560.00 |
| 21 වන වසර | 11,660.00 | 12,580.00 | 13,500.00 | 11,660.00 |
| 22 වන වසර | 11,760.00 | 12,705.00 | 13,650.00 | 11,760.00 |
| 23 වන වසර | 11,860.00 | 12,830.00 | 13,800.00 | 11,860.00 |
| 24 වන වසර | 11,960.00 | 12,955.00 | 13,950.00 | 11,960.00 |
| 25 වන වසර | 12,060.00 | 13,080.00 | 14,100.00 | 12,060.00 |
| 26 වන වසර | 12,160.00 | 13,205.00 | 14,250.00 | 12,160.00 |

11-40/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.